**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අන්තර් පළාත් මගී සේවා අවසර පත්‍ර යාවත්කාලීන කිරීම.**

ඔබගේ මගී සේවා අවසර පත්‍රය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට පැමිණ යාවත්කාලීන කර ගැනීමේදී ඔබට දැරීමට සිදු වන පිරිවැය හා කාලය ඉතුරුකර දීමේ අරමුණින් ඔබගේ මගී සේවා අවසර පත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ යාවත්කාලීන කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

එහි පළමු පියවර ලෙස මහජන පැමිණිලි හා ජංගම පරීක්ෂණ විමර්ශන කටයුතු අවසන් කර ඇති සාමාන්‍ය සේවා මගී සේවා අවසර පත්‍ර **2023/11/01** දින සිට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇති බව සතුටින් දන්වා සිටින අතර ඒ සඳහා උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කරන්න.

## උපදෙස්

1) ඉදිරිපත් කලයුතු ලිපිලේඛණ
   - I. සම්පූර්ණ කරන ලද යාවත්කාලීන කිරීමේ අයදුම්පත
   - II. අවසර පත්‍රය කල් ඉකුත් වී ඇතිනම් ප්‍රමාදයට අදාල අභියාචනා ආකෘති පත්‍රය
   - III. බස් රථයට අදාල වලංගු අසීමිත රක්ෂණය ආවරණ ලිපිය
   - IV. බස් රථයට අදාල වලංගු යෝග්‍යතා සහතිකය
   - V. බස් රථයට අදාල වලංගු ආදායම් බලපත්‍රය හෝ දුම්සහතිකය
   - VI. යාවත්කාලීන කිරීමට ඉදිරිපත් කරන ලේඛණ සත්‍ය හා නිවැරදි බවට කරන දිවුරුම් ප්‍රකාශය

2) අයදුම්පත්‍ර ලබා ගැනීම
   අංක i , ii හා v i ට අදාල ලේඛණ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල Web අඩවිය (ntc.gov.lk) මගින් භාගත කර ගත හැකිය.

3) ලිපි ලේඛණ භාරදීම.
   පහත සඳහන් කර ඇති මාධ්‍ය ඔස්සේ යාවත්කාලීන කිරීමට අදාල ලිපි ලේඛණ එවීමට කටයුතු කල යුතුයි.

**E mail** – permitrenewalonline@ntc.gov.lk

**whatsApp** - **0704361101**

**Tel/Fax** - **0112553144**

4) පොදු උපදෙස්

- ➢ මගී සේවා අවසර පත්‍රය යාවත්කාලීන කිරීම සඳහා අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතු අසීමිත රක්ෂණය, යෝග්‍යතා සහතිකය , ආදායම් බලපත්‍රය හෝ දුම් සහතිකය යන ලියකියවිලි මගී සේවා අවසර පත්‍රය යාවත්කාලීන කිරීමට තොරතුරු ඉදිරිපත් කරන දින සිට ඉදිරියට අවම වශයෙන් දින 30 කට වැඩි කාලයක් වලංගුව තිබිය යුතුය.
- ➢ මගී සේවා අවසර පත්‍රයෙහි වලංගු කාලය ඉකුත්වීමට මාස දෙකකට පෙර සිට මෙම පහසුකම ඔස්සේ අවසර පත්‍රය යාවත්කාලීන කර ගත හැකිය.